ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා (පෞද්ගලික) සමාගම -2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වරාය කළමනාකරණ හා උපදේශක සේවා (පෞද්ගලික) සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) හි ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) අනුකූල නොවීම.

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS For SMEs) ඡේද අංක 4.5 අනුව වාර්තාකරණ දින සිට මාස 12 ක කාලයක් තුළ කල් පිරෙන වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් සමාගම විසින් 2025 අගෝස්තු 08 දින කල් පිරීමට නියමිත රු.මිලියන 10 ක් වූ ස්ථාවර තැන්පතු ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කර නොතිබුණි. ඒ අනුව ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ බැවින් සමාගමේ අවසන් මූල්‍ය ප්‍රකාශන මඟින් එහි ද්‍රවශීලතාවය නිවැරදිව නිරූපණය නොකෙරුණි.	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාකයන් සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හා අනුගතව ජංගම වත්කම් වර්ගීකරණය සිදුකළ යුතු බැවින් 2025 වසරේ ගිණුම් තුළ නිවැරදිව නිරූපණය කිරීමට අපේක්ෂිතය.	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව මූල්‍ය වත්කම් නිසි පරිදි වර්ගීකරණය කළ යුතු බව.
(ආ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS For SMEs) ඡේද අංක 10.13 හා 10.23 ප්‍රකාර ව ප්‍රතිපත්ති වෙනස්වීම් සහ පසුගිය වර්ෂ වැරදීම් සඳහා සිදුකරනු ලබන අතීතයානුයෝගී ගැලපීම් සම්බන්ධයෙන් එකී ප්‍රතිපත්ති වෙනස්වීම් හෝ වැරදීම් හි ස්වභාවය, බලපානු ලබන රේඛීය අයිතමය සහ එහි ප්‍රමාණය දක්වමින් මූල්‍ය ප්‍රකාශයන් හි හෙළිදරව් කිරීමක් සිදු කළ යුතු වුව ද 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන්හි රඳවාගත් ලාභයට ගැලපීම් කර තිබූ, 2017	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 10.21 අනුව දෝෂය නිවැරදි කර ඇත. 1. 2017 වසරේ අධිකරණ තින්දුවක් මත Tangyo Haulage පුද්ගලික සමාගමට ගෙවිය යුතු රු. මිලියන 28.9ක වගකීම ප්‍රවර්තන වර්ෂයේ දී හඳුනාගෙන ඇති අතර 2017 වර්ෂයට අදාලව සිදුකළ යුතු ගැලපුමක් බැවින් සමුච්චිත ආදායමට ගලපා අනාගත වගකීම හඳුනාගෙන ඇත.	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්හි දක්වා ඇති විධිවිධානවලට අනුකූලව පසුගිය වර්ෂ ගැලපීම් සහ හෙළිදරව් කිරීම් සිදු කළ යුතු බව.

	වර්ෂයේ දී අධිකරණ තීන්දුවක් මත පුද්ගලික සමාගමකට ගෙවිය යුතු වියදම රු.මිලියන 28.9 ක් සහ 2021 වර්ෂයේ දී Mccullum Gate පරිශ්‍රය බදු ලබා දීම සම්බන්ධයෙන් වරාය අධිකාරියට ගෙවිය යුතු බදු කුලී වියදම රු.මිලියන 2.7 ක් සම්බන්ධයෙන් එවැනි හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. තව ද, ඡේද අංක 10.12 හා 10.21 ප්‍රකාර ව අදාළ ගෙවිය යුතු වියදම් සඳහා සංසන්දනාත්මක අගය නැවත ගැලපීමක් ද සිදු කර නොතිබුණි.	2. 2021 වර්ෂයේ දී Mccullum Gate පරිශ්‍රය බදු ලබා දීම සම්බන්ධයෙන් වරාය අධිකාරියට ගෙවිය යුතු බදු කුලී වියදම රු.මිලියන 2.7 ක් ප්‍රවර්තන වර්ෂයේ දී ගෙවා ඇති බැවින් සහ ප්‍රමිත අංක 10.22 අනුව ප්‍රවර්තන වර්ෂයේ අදාළ ගැලපුම් කිරීමට ඉඩ ලබාදී ඇති බැවින් ප්‍රවර්තන වර්ෂය තුළ හඳුනාගත් හා ගෙවීම් පියවූ වගකීමක් එයට අදාළ වන පූර්ව කාල පර්ච්ඡේදයට ගැලපීම වඩාත් ප්‍රායෝගික ක්‍රමය බැවින් ඒ අනුව මෙම ගැලපීම් කර ඇත.	
(ඇ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ඡේද අංක (SLFRS for SMEs) 17.29 අනුව වත්කම් විකිණීම මගින් බැහැර කරන අවස්ථාවක දී එකී වත්කම බැහැර කරන දිනය තීරණය කිරීම සඳහා වන කොන්දේසි පැහැදිලි ව දක්වා ඇති අතර සමාගම විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද හා භාවිතයෙන් ඉවත් කරන ලද මුල් පිරිවැය රු.5,196,006 ක් වූ වත්කම් මූල්‍ය වටිනාකම තක්සේරු කර සමාගමේ සේවකයන්ට ප්‍රමුඛතාවය දෙමින් නැවත විකිණීම සඳහා වරාය අධිකාරියේ බහාලුමක ගබඩා කර තිබිය දී ප්‍රමිතියේ සඳහන් කොන්දේසිවලට පටහැනිව 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශයන්ගෙන් බැහැර කර (Derecognized) තිබුණි. තවද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ඡේද අංක (SLFRS for SMEs) 17.19 අනුව වත්කම්වල සුන්බුන් අගය හෝ ප්‍රයෝජනවත් ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව පවත්වාගෙන ගොස් තිබීම හා අදාළ වත්කම් තවදුරටත් සමාගමේ වත්කම් නොවීම මත එම වත්කම් ඉවත් කිරීමේ නිවැරදි ලාභය සමාගමට ගලා ඒම අවිනිශ්චිතව පැවතුණි.	ශුන්‍ය පිරිවැය මත ඉවත් කරන ලද වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කිරීමට ලක් කර ඇති අතර ප්‍රයෝජනවත් ජීවිත කාලයට වඩා භාවිතා කර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 17.27 (අ), (ආ) අනුව මෙම වත්කම් භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව සමාගම මෙම වත්කම් බැහැර කර ගිණුම් තුල ගැලපීම සිදුකර ඇත.	ප්‍රමිතිය ප්‍රකාර ව වත්කම් ඉවත් කිරීමේදී, එකී වත්කමෙහි සැලකිය යුතු අවදානම හා ප්‍රතිලාභ ගැණුම්කරුට මාරු කිරීම, එකී වත්කම් සඳහා තවදුරටත් කළමණාකරණයේ මැදිහත්වීමක් නොමැති වීම හා එකී ගණුදෙණුවට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුළට ගලා ඒම යන කරුණු කෙරෙහි සැලකිලිමත් විය යුතු බව.
(ඈ)	සමාගම විසින් වරාය අධිකාරියේ සේවයේ යොදවනු ලැබූ කම්කරුවන් 08 දෙනෙකු	වරාය අධිකාරියට අවශ්‍ය අමතර කාර්ය මණ්ඩලය ක්‍රොන්ත්‍රාත් /	අස්ථිත්වයක් විසින් අනාගත ආර්ථික

	සඳහා වැටුප් හා වෙනත් ගෙවීම් නිසි කලට නොගෙවීම හේතුවෙන් කම්කරු ආරවුල් මණ්ඩලයේ ගොනු කළ නඩුවක තීන්දුව මත 2023 වර්ෂයේ දී රු.මි. 4.3 ක් ගෙවීමට සමාගමට නියෝගකර තිබුණි. එම වටිනාකම වරාය අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ අපේක්ෂාවෙන් ආරම්භයේදී, වරාය අධිකාරියෙන් ලැබිය යුතු මුදලක් ලෙසත්, සමාගම විසින් ගෙවිය යුතු මුදලක් ලෙසත් ගිණුම්වල සටහන් කර තිබුණි. පසුව එම මුදල සමාගම විසින්ම නිරවුල්කර තිබුණු අතර, වරාය අධිකාරියෙන් ලිඛිත දැනුම්දීමකින් තොරව ලැබිය යුතු මුදල හානිකරණ ලෙස සලකා සියයට 25 බැගින් වර්ෂ 4ක් තුළ කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් තීරණය කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී රු.මි. 1.2 ක් හානිකරණ අලාභ මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ඡේද අංක (SLFRS for SMEs) 2.27 ප්‍රකාරව ගෙවන ලද වන්දිය වියදමක් හඳුනාගෙන නොතිබුණු අතර, ඉහත ගැලපීම් හේතුවෙන් වූ ශුද්ධ බලපෑම වූ රු.මි.3.1 කින් රඳවා ගත් ලාභය වැඩියෙන් දක්වා තිබුණි.	සේවා පැවරුම් මත සමාගමට බඳවාගෙන එම සේවක පිරිවැය වරාය අධිකාරියෙන් ප්‍රතිපූර්ණය කර ගැනීම යටතේ යථෝක්ත ගණුදෙණුව සිදු කර ඇත. ඒ අනුව කම්කරුවන්ට ගෙවීම් සමාගමේ වියදමක් ලෙස හෝ එම වියදම් ප්‍රතිපූර්ණයන් මෙහෙයුම් ආදායම් ලෙස හඳුනාගත නොහැක. තවද මෙම ගෙවීම් ප්‍රතිපූරණය නොකරන බව වරාය අධිකාරිය විසින් ලිඛිතව දැනුම් දී නොමැති අතර වරාය අධිකාරිය සහ සමාගම අතර වන සේවා ගිවිසුමේ 5.3 ප්‍රකාරව වන්දි, ව්‍යස්ථාපිත ගෙවීම් සමාගමට පියවීමට එකඟතාවය පළ කර ඇත. එබැවින් එම වැටුප් ගෙවීම් මෙම සමාගමේ වියදමක් ලෙස හඳුනාගත නොහැක. තවද, ලැබිය යුතු ශේෂ සඳහා අඩමාන ණය වෙන් කිරීම සමාගමේ ප්‍රතිපත්තියට අනුව සිදුකර ඇත.	ප්‍රතිලාභ පිටතට ගලායාම භව්‍ය වන අවස්ථාවන්හි දී සහ එය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක දී වියදමක් හඳුනාගත යුතු බව.
(ඉ)	කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS For SMEs) පරිච්ඡේද අංක 11.21 අනුව අස්ථිත්වයක් විසින් සෑම වර්ෂයකම වාර්තාකරණ දිනට හානිකරණ තක්සේරුවක් සිදු කළ යුතු අතර හානිකරණ අලාභයක් සිදු වී ඇති බවට සාක්ෂි පවතී නම් හානිකරණ අලාභයක් හඳුනා ගත යුතු වේ. එහෙත් සමාගම විසින් ප්‍රමිතියට අනුකූල නොවන පරිදි හානිකරණ සාක්ෂි රහිත ව (without an objective evidence) හා විලම්භිත පදනමක් මත රු.මිලියන 6.1 ක් වූ ණයගැති ශේෂ දෙකක් සඳහා වර්ෂ 4කින් ලාභයට හිලව් වන පරිදි වර්ෂයකට සියයට 25 බැගින් අඩමාන ණය ප්‍රතිපාදනය කිරීමට තීරණය කර තිබූ අතර 2023 සහ 2024 වර්ෂයන්හි දී රු.මිලියන 3.05 ක් අඩමාණ ණය හඳුනාගෙන තිබුණි. ඒ අනුව සමාගමේ රඳවාගත් ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	අඩමාන ණය වෙන් කිරීම සමාගමෙහි ප්‍රතිපත්තියට අනුව සිදුකර ඇත. එම ශේෂයන් අනාගතයේදී අයකර ගැනීමට නොහැකි වුවහොත් එක් කාල පරිච්ඡේදයකට අදාලව එය ලාභයට එරෙහිව කපා හැරීමට සිදුවීම කුඩා ලාභයට හිමිකම් කියනු ලබන මෙවන් සමාගමකට ප්‍රයෝගික නොවනු ඇත. නමුත්, එම ශේෂයන් අය නොවන බවට පැහැදිලිව හඳුනාගැනීමක් හෝ හානි කරන අලාභයක් සිදුව ඇති බවට සාක්ෂි නොමැති බැවින් එම ශේෂයන් බොල් ණය ලෙස එකවර කපා හැරීමටද සමාගමට හැකියාවක් නැත.	ප්‍රමිතිය ප්‍රකාර ව හානිකරණ අලාභ හඳුනා ගැනීමට සමාගම විසින් කටයුතු කළ යුතු බව.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ස්ථාවර තැන්පතු ආදායම සම්බන්ධයෙන් විගණනයේ ගණනය කිරීම් හා සමාගමේ ගණනය කිරීම් අතර රු.620,041 ක වෙනසක් වූ අතර ඒ අනුව එම ප්‍රමාණයෙන් සමාගමේ ලාභය වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු පොළී ආදායම රු.21,915,167ක් වූ අතර ආරම්භක ලැබිය යුතු පොළී ආදායම තුළ ඇතුළත් දෝෂ, ප්‍රවර්තන වර්ෂයේ සමාගමේ ගණනය කිරීම් දෝෂ සහ කාලපරිච්ඡේදයට අදාළව නිසි පරිදි ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සිදු වූ දෝෂ පිළිවෙළින් රු.533,378 ක්, රු.636,878 ක් හා රු.446,451 ක් වශයෙන් සමාගමේ ලැබිය යුතු පොළී ආදායම එකතුව රු.මිලියන 1,616,708 කින් වැඩියෙන් දක්වා තිබුණි.	අදාළ ගැලපීම් 2025 වර්ෂයේ ගිණුම් තුළ සිදුකිරීමට නියමිතය.	ස්ථාවර තැන්පතුවලට අදාළව කාලපරිච්ඡේදයට අදාළ නිවැරදි ආදායම හා ලැබිය යුතු ආදායම හඳුනා ගැනීමට කටයුතු කළ යුතු බව.
(ආ)	ගාලු මුවදොර පරිශ්‍රයේ පිහිටි කඩකාමර 62ක් බදු ලබා දීම සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදුකුලී රු.34,724,856 ක් සමාගම විසින් ගිණුම්ගත කර නොතිබූ අතර ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමේ ආදායම සහ ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	ප්‍රමිත 2.23 හා 2.27 අනුව ආදායමක් හඳුනාගැනීම සඳහා එම අයිතමය සම්බන්ධ ආර්ථික ප්‍රතිලාභයක් ආයතනයට ගලා ඒමට ඉඩ තිබීම දක්වා ඇත. ගාලු මුවදොර පරිශ්‍රයේ අයිතිය සම්බන්ධව පවතින විවාදිත තත්ත්වය නිසා කඩකාමර හා ඇතිකරගත් කිසිදු ගිවිසුමක් ලියාපදිංචි කර නොමැති අතර එබැවින් මාසික කුලී මුදල් එකතු කරගැනීමට නිතීමය සහයෝගය ලබා ගැනිමට ද නොහැකි වී ඇත. එබැවින් අයකර ගැනීමට නොහැකි මුදලක් ආදායම ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමෙන් ප්‍රවර්තන වර්ෂයේ ලාභය අධිගණනය වන අතර එමඟින් සමාගමෙහි ලාභය පිළිබඳ නිවැරදිව අර්ථකථනය නොලැබේ.	ආයතනය විසින් ගිවිසුම් නීත්‍යානුකූල කර ගැනීමට හා ආදායම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු බව.
(ඇ)	සමාගමේ ජංගම ගිණුමට අදාළ බැංකු සැසඳුම අනුව මාස 06 ඉක්ම වූ නිකුත් කළ	එකඟ වේ. 2025 ගිණුම් සැකසිමේදී අවශ්‍ය ගැළපීම් සිදුකරනු ලැබේ.	යල්පැන ගිය චෙක්පත් සහ

	නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ යල්පැන ගිය චෙක්පත් 05ක වටිනාකම රු.910,000 ක් වූ අතර 2024.04.09 දිනැතිව සටහන් කර තිබූ හඳුනා නොගත් රු.604,313 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.		හඳුනානොගත් ගණුදෙණු හඳුනාගෙන නිවැරදි ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු බව.

1.5.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022, 2023 හා 2024 වර්ෂයන්හි දී රු.8,001,721, රු.23,500,115 සහ රු.10,420,717 වශයෙන් සමාගම අඛණ්ඩ මෙහෙයුම් පාඩු ලබා තිබූ අතර එම කාලසීමාව තුළ සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සියයට 1.7 සිට සියයට 1.09 දක්වා පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත. ඒ අනුව අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ අවදානමක් පැවතුණි.	සමාගමෙහි මෙහෙයුම් ලාභය වරාය මෙහෙයුම් මත පදනම් වී ඇති අතර රටෙහි පැවති ආර්ථික අවපාතය වරාය මෙහෙයුම් කෙරෙහි බලපෑ බැවින් සමාගමෙහි කොමිස් ආදායම් අඩුවීමට එය බලපාන ලදී. ආයතනය 2016 වසරට පෙර සිට මෙහෙයුම් අලාභ ලබා ඇතත් අඛණ්ඩ පැවැත්ම ආරක්ෂා කරගෙන ඇත. 2023 වසරට සාපේක්ෂව 2024 මෙහෙයුම් අලාභය 56% ක් අඩු අතර 2025 වසරේදී ලාභයක් ඉලක්කගත කර ඇත. අලාභ ලබන මෙහෙයුම් කෙරෙහි විශේෂිත අවධානය ලක් කර ඇත.	මෙහෙයුම් අලාභය අවම කිරීමට සහ අඛණ්ඩ පැවැත්ම ආරක්ෂා කර ගැනීමට සමාගම විසින් කටයුතු කළ යුතු බව.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	තෙවන පාර්ශවයකට බදුදීම සඳහා වරාය අධිකාරිය විසින් 2017 වර්ෂයේදී සමාගම වෙත පවරා තිබූ මැකලම්ලොක් ගේට් පරිශ්‍රය සමාගම විසින් ට්‍රැවල් ටෝක් ආයතනය වෙත බදු ලබා දී තිබූ අතර 2020 අප්‍රේල් සිට අගෝස්තු දක්වා මුලින් බදු දුන් සමාගම විසින් ආයතනය වෙත ගෙවිය යුතු බදු, විදුලි බිල සහ අධිභාරය ද සහිත මුළු හිඟ මුදල රු.4,477,679 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තව ද, බදු ගිවිසුම 1949 අංක 13 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ IV වන	එකඟ වේ. මෙම හිඟ මුදල් අයකර ගැනීම හා නෛතික ක්‍රියාවලිය සම්බන්ධව වරාය, නාවික ප්‍රවාහන හා ගුවන් සේවා අමාත්‍ය හරහා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. සමාගම සහ Travel talk අතර මැකලම් පරිශ්‍රය සඳහා ගිවිසුමක් පැවතිය ද වරාය අධිකාරිය සහ සමාගම අතර ගිවිසුමක් නොතිබූ නිසා තෙවන පාර්ශවය සමඟ පැවති ගිවිසුම නීත්‍යානුකූලව ලියාපදිංචි කිරීමට හැකියාවක් තිබී නොමැත.	අදාළ අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට සමාගම කටයුතු කළ යුතු අතර ලිඛිත සහ නීත්‍යානුකූල ගිවිසුම් යටතේ ගණුදෙණුවලට එළඹීමට සමාගම විසින් කටයුතු කළ යුතු බව.

පරිච්ඡේදය අනුව ලියාපදිංචි කර නොමැති බැවින් නීතිමය ක්‍රියාමාර්ගවලට එළඹිය නොහැකිවීමේ අවදානමක් පැවතුණි.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මෙහෙයුම් අත්පොතෙහි 6.2 (v) පරිච්ඡේදය	පසුගිය වර්ෂයන් දෙකකදී සාමාන්‍ය වාර්ෂික ආදායම රු.බිලියන 30 ට අඩු, පුනරාවර්තන වියදම් සඳහා අයවැය ප්‍රතිපාදන සහාය නොලැබෙන රාජ්‍ය ව්‍යවසායන් විසින් සිය අතිරික්ත අරමුදල් රජය සතු බැංකු, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල පමණක් ආයෝජනය කළ යුතු වුව ද සමාගම විසින් රු.මිලියන 100 ක් පෞද්ගලික බැංකුවක ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණි.	පොළී අනුපාත පිලිබඳ පරීක්ෂා කර වඩා ලාභදායී විකල්පයක් ලෙස වැඩි පොළී අනුපාතයක් සහිත පුද්ගලික බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත වසර 05ක කාලයක් සඳහා ආයෝජනය සිදුකර ඇත.	චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති කරුණුවලට අනුකූලව අතිරික්ත අරමුදල් ආයෝජනය කළ යුතු බව.
(ආ)	2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති අංක 123 සහ 124	සෑම සමාගමක්ම තම කොටස් අයිතිකරුවන්ගේ විස්තර සහිත කොටස් ලියාපදිංචි පොතක් (Share Register) පවත්වා ගෙන යා යුතු වුව ද සමාගම විසින් කොටස් ලියාපදිංචි පොතක් පවත්වාගෙන ගොස් නොතිබුණි. තව ද කොටස්කරුවන් 11 දෙනෙකු සඳහා නිකුත් කරන ලද කොටස් සහතිකපත් පිටපත් විගණනයට ඉදිරිපත් නොවුණි.	එකඟ වේ.	පනතේ වගන්ති ප්‍රකාරව කොටස් ලියාපදිංචි පොතක් පවත්වාගෙන යා යුතු බව.

1.8 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම විසින් භාවිතා කරනු ලබන පරිසනකගත ගිණුම්කරණ පද්ධතිය සකස් කිරීමක් (customized) සිදු කර නොමැති අතර ගිණුම් වර්ෂයකට අදාළ ව ගිණුම්කරණ කටයුතු අවසන් කර විගණනයට ගිණුම් ඉදිරිපත් කිරීමෙන් පසුව වුව ද (after locking the Fiscal year) පද්ධතියට ගනුදෙනු ඇතුළත් කිරීමේ හැකියාවක් පවතින බව නිරීක්ෂණය වූ අතර විගණිත ගිණුම්කරණ දත්තයන් ස්ථාවර සහ විශ්වාසදායක ලෙස පවතින බවට තහවුරුවක් ලබා දීමට නොහැකි විය.	සමාගම විසින් 2025 වර්ෂයේදී ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති අතර එහිදී වඩාත් නිවැරදි හා ප්‍රායෝගික ක්‍රමවේදය අනුව ගිණුම් සකස් කිරීමට නියමිතය. ඒ අනුව මෙම අඩුපාඩුව ඉවත්වනු ඇත.	ගිණුම්කරණ දත්තයන් ස්ථාවර සහ විශ්වාසදායක ලෙස පවතින බවට තහවුරුවක් ලබා දීමට හැකි වන පරිදි සමාගමේ ගිණුම්කරණ පද්ධතිය සකස් කළ යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.10,420,717 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.23,500,115 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,079,398 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට කම්කරුවන් කුලියට සැපයීමේ සේවාවෙන් ලැබුණු ආදායම රු. 62,827,844 කින් එනම් සියයට 851 කින් වැඩිවීම, සේවා ගාස්තුවලින් ලැබුණු ආදායම රු.19,698,807 කින් එනම් සියයට 113 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම විශ්ලේෂණය පහත පරිදි වේ.

අයිතමය	2024	2023	වැඩිවීම/ (අඩුවීම)	ප්‍රතිශතය% වැඩිවීම/ (අඩුවීම)
ආදායම	රු.	රු.	රු.	
සේවා ගාස්තු ආදායම	37,155,730	17,456,923	19,698,807	113
සනීපාරක්ෂක සේවා ආදායම	96,723,913	71,640,105	25,083,808	35
ගාලු මුවදොරපිටියෙන් ලද ආදායම	26,591,107	21,111,719	5,479,388	26
කම්කරුවන් කුලියට සැපයීමේ සේවා ආදායම	70,208,026	7,380,182	62,827,844	851
වෙනත් ආදායම්	1,115,000	594,857	520,143	87
ආයතන හා පරිපාලන වියදම්				
වැටුප් හා වේතන	24,088,096	18,994,361	5,093,735	26
ඉහළ කළමනාකරණ වැටුප්	6,723,505	2,315,000	4,408,505	190
පාරිතෝෂික වියදම්	4,467,488	2,579,104	1,888,384	73

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සේවා ගාස්තු වලින් ලද ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.19,698,807කින් එනම් සියයට 113ක වර්ධනයක් පැවතුණි. සමාගම විසින් අන්තර් බහාලුම් ප්‍රවාහන සේවා (Inter Terminal Trucking) නමින් නව ව්‍යාපෘතියක් ආරම්භ කර ආදායම් උපයා තිබීම මීට හේතු වී තිබුණි.

(ආ) වැටුප් හා වේතන, ඉහළ කළමණාකරණ වැටුප් හා පාරිතෝෂික වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් රු. 5,093,735 ක් 4,408,505 ක් සහ රු. 1,888,384 කින් එනම් සියයට 26 ක් 190 ක් සහ සියයට 73කින් ඉහළ ගොස් තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සමාලෝචිත වර්ෂය තුළදී සේවක වැටුප් වැඩි කිරීම මීට හේතු වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පහත පරිදි වේ.

	2024	2023
<u>ද්‍රවශීලතා අනුපාත</u>		
ජංගම අනුපාතය	1.1	1.5
ක්ෂණික අනුපාතය	1.1	1.5

ද්‍රවශීලතා අනුපාතය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 40 කින් පමණ පහළ ගොස් තිබූ අතර ජංගම වත්කම් වැඩිවීමට වඩා වැඩි ප්‍රතිශතයකින් ජංගම වගකීම් ඉහළ යාම මෙම ඍණාත්මක බලපෑමට හේතු වී තිබුණි. ගාලු මුවදොර පිටිය පරිපාලන ව්‍යාපෘතිය යටතේ කඩ හිමියන්ගෙන් නැවත ගෙවිය යුතු තැන්පතුවක් ලබා ගැනීම හා 2017 වර්ෂයේ අධිකරණ තීන්දුවක් මත පෞද්ගලික සමාගමකට ගෙවිය යුතු රු.මිලියන 28.9 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදමක් ලෙස හඳුනා ගැනීම ජංගම වගකීම් වැඩි වීමට හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාගම විසින් සිදුකරනු ලබන ගාලුමුවදොර පිටිය පරිපාලනය ව්‍යාපාරයෙහි 2020 සිට 2024 දක්වා පසුගිය වර්ෂ 5 තුළ දිගින් දිගටම අලාභදායී තත්ත්වයක් පැවතුණි. ගාලුමුව දොර පිටියේ වෙරළ තීරයට යාබදව පිහිටා ඇති භූගත කඩ කාමර 42න් (B-Zone) කඩ කාමර 03 ක් 2025 මැයි වන විටත් බදු දීමට නොහැකි වී තිබූ අතර ගාලුපාරට යාබදව පිහිටා ඇති භූගත කඩකාමර 20 (A-Zone) න් 16 ක් හා වෙරළ තීරයට යාබදව පිහිටා ඇති භූගත කඩ කාමර 42 (B-Zone) න් 11 ක් තාවකාලිකව වසාදමා තිබුණි. ඒඅනුව බදු දීමට නොහැකි වූ කඩ කාමර 03 සඳහා 2024 වර්ෂය තුළ දී පමණක් සමාගමට අහිමිව තිබූ බදු කුලිය ආසන්න වශයෙන් රු.1,080,000ක් විය. "ගාලුමුවදොර පිටියෙහි පරිපාලන හා මෙහෙයුම් කටයුතු පාලනය" සම්බන්ධයෙන් 2024 නොවැම්බර් 12 දිනැති අංක අමප/24/2020/713/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ගාලුමුවදොර පිටියෙහි බදු පදනම මත ලබා දී ඇති එහෙත් මේවන තෙක් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකරන ලද හෝ ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් නොගෙවූවන්ගේ කඩ කාමර 2024 නොවැම්බර් 30 වන දිනට අවලංගු කිරීමට කටයුතු කිරීමට තීරණය කර තිබුණ ද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අදාළ ගිවිසුම් අවලංගු කිරීමට 2025 මැයි මස දක්වා සමාගම කටයුතු කර නොතිබුණි.	ආදායම් මාර්ග වැඩි දියුණු හා ක්‍රමවත් කිරීමට අවශ්‍ය කටයුතු කළමණාකාරිත්වය ගෙන ඇති අතර 2025 වසරේදී ලාභයක් වාර්තා කිරීම අපේක්ෂිතය. ගාලුමුවදොර පිටියේ පවත්නා අනවසර වෙළඳුන් හා නීතිවිරෝධී ව්‍යවසායන්, කොළඹ මහනගර සභාව යටතේ පාලනය වන වාහන නැවතුම් භූමි භාගයෙහි වාහන නැවතුම් භූමි පාලන නිලධාරීන් විසින් අනවසර වෙළඳුන් සඳහා අඩු මුදලට වෙළඳාම් කටයුතු සිදු කිරීමට ඉඩ ලබාදීම තුළින් ගාලුමුවදොර පිටියේ වෙළඳුන් හට වෙළඳාමක් සිදු නොවීම සහ කඩකාමර කිහිපයක් වසා දැමීම හේතුවෙන් බදුකුලී ගෙවීම පැහැර හැර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, කුලී ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් කොටුව පොලිස් ස්ථානයට පැමිණිලි ඉදිරිපත් කළද, ගිවිසුම් නීතිය යටතේ ඇති කර ගත් ගිවිසුම් කඩකිරීම් වන බැවින්, සිවිල් නඩු පැවරීම මගින් විසඳිය යුතු බවට උපදෙස් දී ඇත. ඒ අනුව, අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට "පරිශ්‍රය නැවත භාරගැනීමේ පනත" ප්‍රකාරව කටයුතු කරමින් සිටියි. ඉල්ලීම් ලිපි (Demand Notice) නිකුත් කිරීම, නීති උපදේශක මාර්ගයෙන් නීතිමය දැන්වීම් නිකුත් කිරීම, අධිකරණයේ නඩු පැවරීම සඳහා සූදානම් වීම යන පියවර ගෙන ඇත.	ආදායම් නිසි පරිදි රැස් කිරීමට අවධානය යොමු කළ යුතු අතර බදුකුලී නොගෙවන කඩ හිමියන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු බව.

(ආ)	වරාය අධිකාරියට අයත් ඉඩම් පරිශ්‍රයක් වන මැක්ලම් ලොක් ගේට් පරිශ්‍රය තෙවන පාර්ශවයකට බදුදීම සඳහා 2017 වර්ෂයේදී ආයතනය වෙත පවරා ඇති අතර සමාගම විසින් පෞද්ගලික සමාගමක් සමඟ 2018 සිට 2023 වර්ෂය දක්වා වසර 05ක් සඳහා ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් 2020 වර්ෂයේ දී එම පෞද්ගලික සමාගම ව්‍යාපාර කටයුතු වලින් ඉවත් වී තිබූ අතර ගිවිසුම් කාලය අවසන් වීමත් සමඟ වරාය අධිකාරියේ ලිඛිත එකඟතාවයක් නොමැතිව තවත් පෞද්ගලික සමාගමක් සමඟ 2023 වර්ෂයේ දී ගිවිසුම් ගත වී පරිශ්‍රය බදු දී තිබුණි. වරාය අධිකාරියේ ලිඛිත එකඟතාවයක් නොමැතිව දෙවනුවට බදු දුන් සමාගම වෙත පරිශ්‍රය බදු දීම නිසා එම ආයතනයට 2023 මාර්තු 01 දින සිට විගණන අවස්ථාව වූ 2025 අප්‍රේල් මස දක්වා මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබූ අතර සමාගමට අහිමි ව තිබූ බදු ආදායම ආසන්න වශයෙන් රු.16,169,000 ක් විය. තවද, සමාගම විසින් ටෙන්ඩර් කැඳවීම සිදු කර ඇති බැවින් සහ ලේක් වීව් ආයතනය විසින් අදාළ පරිශ්‍රයේ ඉදිකිරීම් කිහිපයක් ද සිදු කර ඇති බැවින් ගිවිසුම අහෝසි කිරීම ද, අදාළ පරිශ්‍රය වරාය අධිකාරිය වෙත නැවත භාරදෙන ලෙස දන්වා ඇති බැවින් එසේ භාරදීම සම්බන්ධව ද ගැටලුකාරී තත්ත්වයක් පැවතුණි.	එකඟ වේ. මේ සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් සපයා ඇත.	ලිඛිත සහ නීත්‍යානුකූල ගිවිසුම් යටතේ ගණුදෙණු වලට එළඹීමට සමාගම කටයුතු කළ යුතු බව.

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛ අංක 8 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ		

(i)	1.2.1 (ඇ) පරිච්ඡේදය අනුව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගි වීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථාව ලබාදීම ප්‍රධාන ප්‍රසම්පාදන අරමුණක් ලෙස දක්වා තිබුණ ද, සමාගමේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව සිදු කරනු ලබන සියලු ප්‍රසම්පාදනයන් සඳහා වෙළෙඳපළ මිල සැඳහුම් ක්‍රමය භාවිතා කළ යුතු බව දක්වා තිබීම නිසා එකී ප්‍රසම්පාදන අරමුණ ඉටු වී නොතිබුණි.	එකඟ නොවේ. සමාගම විසින් ප්‍රධාන වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලින් දෙකක් අනුගමනය කරයි. 1. වරාය අධිකාරිය වෙත අවශ්‍ය උපකරණ සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් පාර්ශවයන් සැපයීම / පරිශ්‍ර බඳු දීම (ටෙන්ඩර් ක්‍රමවේදය) යන කාර්යයේදී පුවත්පත් දැන්වීම් පළකර උනන්දුවක් දක්වන පාර්ශවයන්ගෙන් මිළ ගණන් කැඳවීමක් සිදුකරනු ලබයි. 2. සමාගමේ මෙහෙයුම් හා පරිපාලනය සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා මිලදී ගැනීම බොහෝ විට විශාල අගයන්ගෙන් සැදුම්ලත් මිලදී ගැනීම් නොවන බැවින් සඳහා වෙළඳපොළ මිළ සැසඳුම් ක්‍රමවේදය භාවිතා කරයි.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනය කළ යුතු භාණ්ඩ හා සේවා ස්වාභාවය, තරඟකාරිත්වය හා වෙළඳපල වටිනාකම, ප්‍රසම්පාදනයේ ස්වාභාවය යනාදී කරුණු මත පදනම් ව භාවිතා කළයුතු ප්‍රසම්පාදන ක්‍රමය තීරණය කළ යුතු බව.
(ii)	2.8.1 (අ) පරිච්ඡේදය අනුව ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්, තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් නොවිය යුතු වුව ද, සමාගමේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව සුළු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන්හි තාක්ෂණික ඇගයීම් කමිටුව ද එම කමිටුව විසින් නියෝජනය කළ යුතු බව දක්වා තිබුණි.	විගණනයේ නිර්දේශවලට ඉදිරියේදී අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත්කළ යුතු බව.
(iii)	3.4.3 (ඇ) පරිච්ඡේදය අනුව ලියාපදිංචි සැපයුම්කරු ලැයිස්තුව වර්ෂයකට වරක් යාවත්කාලීන කළ යුතු නමුත් සමාගමේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුව ලියාපදිංචි සැපයුම්කරු ලැයිස්තුව වසර 4කට වරක්වත් යාවත්කාලීන විය යුතු බව දක්වා තිබුණි.	බොහෝවිට සමාගම විසින් වරාය අධිකාරිය වෙත අවශ්‍ය උපකාරක සේවා සැපයීමට බාහිර සේවා ලබා ගනී. යම් නිශ්චිත සේවාවන් සඳහා නිශ්චිත රේටයන්ට අනුව නියමිත කාලසීමාවක් සඳහා සේවා සැපයුම්කරුවන් සමඟ ගිවිසුමකට බැඳෙන බැවින් සෑම වසරකම සැපයුම්කරුවන් ලියාපදිංචිය ප්‍රායෝගික නොවේ. සමාගමේ මෙහෙයුම් සඳහා භාණ්ඩ මිලදී ගැනීම ප්‍රමාණාත්මකව කුඩා අගයක් ගන්නා නිසා සෑම වසරකම සැපයුම්කරුවන් ලියාපදිංචිය ද ප්‍රයෝගික නොවේ.	විනිවිදභාවය, තරඟකාරිත්වය යනා දී ප්‍රසම්පාදන අරමුණු ඉටුවීම තහවුරු වනු වස් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ලියාපදිංචි සැපයුම්කරු ලැයිස්තුව යාවත්කාලීන කළ යුතු බව.

(iv)	4.2.1 (අ) පරිච්ඡේදය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු බව සඳහන් වුව ද, සමාගම විසින් 2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	එකඟ වේ. ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කෙරේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු බව.
(ආ)	2024 මැයි 17 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව පෞද්ගලික සමාගමක් වෙතින් රු.8,709,890 ක් වැයකර කාර්යාල පරිශ්‍රය නවීකරණය කර තිබූ අතර මෝටර් රථ සමාගමකින් රු.1,275,900 ක් වැයකර බජාජ් යතුරුපැදි 2 ක් මිලදී ගෙන තිබුණි. 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායාතන චක්‍රලේඛ අංක 8 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව යථෝක්ත ප්‍රසම්පාදනයන් සිදු කිරීමේ දී ප්‍රශස්ථ මට්ටමේ මිළ ගණන් කැඳවීමක් සඳහා ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය භාවිතා කිරීම වඩා සුදුසු වුව ද ප්‍රසිද්ධ මිළ ගණන් කැඳවීමක් සිදු කර නොතිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1. (අ) , (ආ) සහ 5.2.1 (අ) ප්‍රකාරව ලංසු ලේඛන පිළියෙල කර නොතිබුණි. එමෙන්ම ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 6.3.3 (ආ) ප්‍රකාරව ප්‍රසිද්ධ ලංසු විවෘත කිරීමක් සිදු කළ බවට තොරතුරු ඉදිරිපත් නොවූ අතර ඡේද 7.7.1 (අ) අනුව ලංසු ඇගයීමක් සිදු කළ බවට තොරතුරු ද ඉදිරිපත් නොවුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 8.9 ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුලත් විය යුතු බව සඳහන් වුවද, සමාගම විසින් කාර්යාල	එකඟ වේ. ඉදිරියේදී අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ලංසු ලේඛන පිළියෙළ කිරීම, ලංසු විවෘත කිරීම, ලංසු ඇගයීම් සහ එකඟ වූ කරුණු ඇතුළත් කර විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹිය යුතු බව.

	ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ කාර්යය සඳහා තෝරා ගන්නා ලද ආයතනය සමඟ විධිමත් ගිවිසුමකටද එළඹ නොතිබුණි.		

3.3 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.2 පරිච්ඡේදය ප්‍රකාරව සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සඳහා සහ සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	එකඟ වේ. ඉදිරියේදි අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	අදාළ චක්‍රලේඛ ප්‍රකාරව සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු බව.
(ආ)	සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩලය 38 ක් සහ තත්‍ය කාර්යමණ්ඩලය 17ක් වූ අතර තනතුරු 21ක පුරප්පාඩු තිබුණු බැවින් සමාගම විසින් ප්‍රශස්ථ මට්ටමෙන් කාර්යය මණ්ඩලය යෙදවීමට කටයුතු කර නොතිබුණි.	සමාගමේ පවතින අරමුදල් හා ලාභදායිත්වය පදනම් කරගෙන අත්‍යවශය කාර්ය මණ්ඩලය පමණක් බඳවාගෙන මෙහෙයුම් සිදු කිරීමට කටයුතු කර ඇති අතර, අවශ්‍යතාවය හා ධාරිතාව මත ඉදිරියේදී අවශ්‍ය කාර්ය මණ්ඩලය කලින් කලට බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිතය.	කාර්ය මණ්ඩලය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාමට සමාගම විසින් කටයුතු කළ යුතු බව.
(ඇ)	මානව සම්පත් කළමනාකරණ ගැටලු හා නිතිමය ගැටලු විසඳීමේ අරමුණෙන් සමාගම විසින් උපදේශකවරුන් දෙදෙනෙකු බඳවාගෙන තිබුණු නමුත් එම නිලධාරීන් ඉටුකළ කාර්යයන් පිළිබඳ කාලීනව සිදු කළ අධික්ෂණයක් හා ඉටුකළ කාර්යය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. එම නිලධාරීන්ට සමාලෝචිත වර්ෂය තුළ රු.2,050,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණද සමාගමේ නඩු කටයුතු ද බාහිර පාර්ශවයන් මගින් ඉටුකර ගෙන තිබූ අතර ඒ සඳහා ප්‍රවර්තන වර්ෂයේදී රු.1,347,092 ක් ගෙවා තිබුණි.	එකඟ වේ.	සමාගමේ මානව සම්පත එලදායී ලෙස උපයෝජනය කළ යුතු අතර අනවශ්‍ය වියදම් අවම කළ යුතු බව.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 පරිච්ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තුමේන්තුව හෝ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තුමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාගම විසින් 2024 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	එකඟ වේ. ඉදිරියේදී අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සමඟ අවසන් කරන ලද උපායමාර්ගික සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 පරිච්ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හෝ ආයතන ප්‍රධානියාට ඍජුව වාර්තා කිරීමට හැකිවන පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු බව සඳහන් වුවද සමාගමෙහි අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාර්යය මණ්ඩලය තුළද අභ්‍යන්තර විගණන තනතුර ඇතුලත්ව නොතිබුණි.	එකඟ වේ. ඉදිරියේදී අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛයෙහි දක්වා ඇති විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීම සඳහා සමාගම විසින් කටයුතු කළ යුතු බව.

4.3 **අභ්‍යන්තර විගණන කමිටු**

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය මඟින් ප්‍රකාශිත රජය සතු ව්‍යවසායන් සඳහා වන ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 පරිච්ඡේදය ප්‍රකාරව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 කින් සමන්විත වන අයුරින් අභ්‍යන්තර විගණන කමිටුවක් පත්කරගත යුතු අතර එකී විගණන කමිටුව අවම වශයෙන් මාස 3කට වරක්වත් රැස්විය යුතු වුවද සමාගම විසින් අභ්‍යන්තර විගණන කමිටුවක් පත්කරගෙන විගණන කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වේ. ඉදිරියේදී අනුගත වීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන කමිටු පත් කිරීමටත්, විගණන කමිටු රැස්වීම් පැවැත්වීමටත් කටයුතු කළ යුතු බව.